## බී.කේ.ජී. ධනපාල එ. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ 976 /2019 (2019.05.07 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය)**,** රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණි වල්ගම

**අභියාචක** - බී.කේ.ජී. ධනපාල
**නොතිසි ලත් පාර්ශවය** - නම් කළ නිලධාරී, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

**පෙනීසිටීම**
අභියාචක - බී.කේ.ජී. ධනපාල
පොදු අධිකාරිය - පෙනී නොසිටින ලදි

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.06.22 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2018.07.18 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.07.30 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2018.08.23 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.12.13 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2018.06.22 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත දැක්වෙන තොරතුරු ඉල්ලා සිටින ලදි.

***ක.සි. අංක 320552:02:48:49:46 හා 50 ඉඩම් සම්බන්ධවයි යන හිසින් යුතු ඔබ කාර්යාලයෙන් ලද 2015.04.06 දාතම ලිපියට අදාළ පහත සඳහන් තොරතුරු***

1. ***320552/02/54* හි ඉඩම් හිමිකරු විසින් ඉදිරිපත් කර ඇති සියලුම විරෝධතාවයන්ට අදාළ පැමිණිලිවල සියලුම පිටපත්**
2. ***2015.05.22* දින ඔබ කාර්යාලය මඟින් සිදුකරන ලද ස්ථානීය පරීක්ෂණයේදී ඉහත ඉඩම් හිමිකරු විසින් ලබාදුන් කට උත්තරයට අදාළ තොරතුරු සහිත පිටපත**
3. ***2015.05.22* දිනට පසුව ඉහත සඳහන් ඉඩම් හිමිකරු විසින් මෙකී කාරණය පිළිබඳව කරන ලද සියලු ඉදිරිපත් කිරීම්වල පිටපත්**
4. ***අවශ්‍ය විටකදී මෙම කරුණට අදාළ ලිපිගොනුව පරිශීලනය කොට අවශ්‍ය පිටපත් ලබාදීමේ අනුමැතිය***
5. ***මෙම කරුණ සම්බන්ධයෙන් සිදු කරන ලද රාජකාරීමය කටයුතුවලට අදාළ ගොනුවේ ඇති ලිපිවල පිටපත්***

2018.07.18 දින තොරතුරු ඉල්ලීමට ප්‍රතිචාර දක්වමින් දන්වා සිටින ලද්දේ වෙනත් පාර්ශ්වයක් විසින් ලබාදුන් තොරතුරක් වන බැවින් හා කාර්යාලීය රාජකාරී අවශ්‍යතාව මත ගොනුව පවත්වාගෙන යනු ලබන අතර ඒ සඳහා ලබාගත් ලේඛනයක් බාහිර පාර්ශ්වයකට නිකුත් කළ නොහැකි බවත්, පුද්ගලිකව පරීක්ෂා කර බැලීමටත් පිටපත් ලබා ගැනීමටත් අනුමැතිය ලබා දිය නොහැකි බවයි. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2018.07.30 දින නම්කළ නිලධාරියාට අභියාචනයක් යොමුකරන ලදි. නම්කළ නිලධාරිය 2018.08.23 දින ප්‍රතිචාර දක්වමින් දන්වා සිටින ලද්දේ විරෝධතාවය පිළිබඳ පිටපත් වෙනත් පාර්ශ්වයක් විසින් ලබා දුන් තොරතුරක් වන බැවින් එම ලේඛන අභියාචක වෙත නිකුත් කළ නොහැකි බවත්, මෙම ගැටලුවට අදාළව ඉදිරි කටයුතුවලට සියලු පාර්ශ්වයන් කැඳවා නැවත ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකිරීමට කටයුතු යොදා ඇතිබව යටිනුවර ප්‍රාදේශීය කාර්යාලයෙන් දැනුම් දී ඇති බවත්, යම් අධිකරණ ක්‍රියාමාර්ගයක් ගැනීමේ අරමුණින් අභියාචක විසින් මෙම ලේඛන පිටපත් ඉල්ලුම් කරනු ලබන්නේ නම් එවැනි අවස්ථාවකදී අදාළ ලේඛන ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමට හැකියාවක් ඇති බවත් ය. මෙම ප්‍රතිචාරයෙන්ද අතෘප්තියට පත් අභියාචක 2018.12.13 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමුකරන ලදි.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

පොදු අධිකාරිය අභියාචනා විභාගයට නොපැමිණෙන ලදී.

පොදු අධිකාරිය විසින් 2019.04.24 දිනැතිව කොමිෂන් සභාවට එවා ඇති ලිපිය කෙරෙහි කොමිෂන් සභාවේ අවධානය යොමුවිය. එහි සඳහන් වන්නේ, අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු වෙනත් පාර්ශ්වයකට අදාළ වන බැවින් හා කාර්යාලීය අවශ්‍යතාවය මත පවත්වාගෙන යන ගොනුවල ලේඛන පිටපත් බාහිර පාර්ශ්වයකට ලබාදිය නොහැකි බැවිනුත් පනතේ 5(1)(2) අනුව තොරතුරු ලබා දිය නොහැකි බව දක්වමින් 2018.07.16 දිනැතිව පිළිතුරු යැවූ බවය. එසේම, ඒ පිළිබඳව යටිනුවර ප්‍රාදේශීය කාර්යාලය වෙත තවදුරටත් කරුණු විමසීමේදී අදාළ ගොනුවෙහි අදාළ පාර්ශවයන් විසින් යොමුකරන ලද ලිපි පමණක් ඇතුළත්ව ඇති බවත් විමර්ශන වාර්තා හෝ ඉඩම් හිමියන්ගේ ප්‍රකාශ වැනි ලේඛන ඇතුළත්ව නොමැති බවත් අනාවරණය වූ අතර දැනට ගොනුවෙහි ඇතුළත් කර තිබෙන ලේඛන යම් අධිකරණ කාර්යයක් සඳහා අවශ්‍ය වන්නේ නම් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට හැකි බවද දන්වා ඇති බවය. එසේම මේ පිළිබඳව තවදුරටත් විමර්ශන කටයුතු සිදු කෙරෙමින් පවතින බවත්, ලියුම්කරු නොව අනෙක් පාර්ශ්වය වෙනුවෙන් ඉදිරිපත්වන ඇටර්නි බලකරු 2019.05.31 දින දක්වා විදේශගතවන බැවින් ඔහු නැවත පැමිණි පසුව විමර්ශන කටයුතු ඉදිරියට සිදුකරගෙන යාමට අපේක්ෂා කරන බවත් ප්‍රාදේශීය කාර්යාලය (යටිනුවර) විසින් දැනුම් දෙන ලද බවත්ය.

අභියාචනා විභාගයේදී අභියාචක විසින් කරුණු දක්වා සිටියේ තොරතුරු නිළධාරියා හා අභියාචනා නිළධාරියා දෙදෙනෙකු නොව එකම අයෙකු වන බවත් එබැවින් පොදු අධිකාරියේ කරුණු දැක්වීම පිළිගත නොහැකි බවත්ය.

මෙම කරුණු දැක්වීම සම්බන්ධව කොමිෂන් සභාවේ දැඩි අවධානය යොමු වූ අතර මෙහිදී කොමිෂන් සභාව අවධාරණය කර සිටියේ කොමිෂන් සභා රීති ප්‍රකාරව යම් ආයතනයක නම්කළ නිලධාරියෙකු නම්කර නොමැති නම් එම ආයතනයේ ප්‍රධානියා නම්කළ නිලධාරියාගේ තනතුරට නිතැතින්ම පත්වන බවත් තොරතුරු නිලධාරියා හා නම්කළ නිලධාරියාගේ නම් අදාළ ආයතනයේ අනිවාර්යෙන්ම ප්‍රදර්ශනය කර තිබිය යුතු බවත්ය.

එසේම කොමිෂන් සභාව විසින් තවදුරටත් නිරීක්ෂණය කරනු ලබන්නේ පොදු අධිකාරිය විසින් අදාළ තොරතුරු ප්‍රතික්ෂේප කර ඇත්තේ පදනම් විරහිත ආකාරයට බවත් එය පනත අනුව නොවන බවත්ය.

**නියෝගය:**

මෙම කරුණු නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව නියෝග කර සිටිනුයේ අදාළ පොදු අධිකාරිය අභියාචනය සඳහා නොපැමිණීම පිළිබඳව අවවාදාත්මක ලිපියක් යොමුකරන ලෙසත් මීළඟ අභියාචනා විභාගය සඳහා පොදු අධිකාරියේ පැමිණීම අනිවාර්ය වන බවත්ය. එසේම කොමිෂන් සභාව විසින් නියම කරන දියනයන්හිදී කොමිෂන් සභාව ඉදිරියේ පෙනී නොසිටීම පනතේ 39(1)(ඇ) යටතේ වරදක් වන බවටද පොදු අධිකාරියට මින් දන්වනු ලැබේ.

ඒ අනුව මීළඟ අභියාචනා විභාගය 2019.08.05 දිනට කල්තබනු ලැබේ.

****

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.